# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 1.45 යි    තැපැල් ගාස්තුව : රු. 1.00 යි

# 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 56/78.

**ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය හා බලතල

*ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පිහිටුවීම.*

2. මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන, "ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූ බැංකුවක් නියමිත දිනයෙහි දී හෝ ඉන් පසුව හැකි ඉක්මණින් හෝ පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ බැංකුව තත්කාලයේ ඒ බැංකුවේ කොටස් හිමියන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

*බැංකුව සංස්ථාගත මණ්ඩලයක් විය යුතු බව.*

3. ඒ බැංකුව 2 වන වගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය; තව ද ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

*බැංකුවේ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල.*

4. බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන පරිදි, කොළඹ හැර ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථානවල බැංකුවේ ශාඛා කාර්යාල පිහිටුවනු ලැබිය හැකි ය.

*බැංකුවේ අරමුණු.*

5. (1) වෙනත් කරුණුවලට අමතරව, විශේෂයෙන් ම ග්‍රාමීය අංශය සංවර්ධනය කිරීම ද සැලකිල්ලට ගනිමින්, පහත සඳහන් ක්‍රියා මාර්ග මගින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව, කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සංවර්ධනය සහ වෙනත් සංවර්ධනයන් සලස්වා, එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය දියුණු කිරීම බැංකුවේ අරමුණු විය යුතු ය:—

(අ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සහ වෙනත් ව්‍යවසායන්ට මධ්‍යම කාල හා දීර්ඝ කාල ණය සහ වෙනත් ආකාර ආධාර සැපයීමෙන්;

(ආ) ශ්‍රී ලංකාවේ ආයෝජන, කොටස් සහ සුරැකුම්පත් වෙළෙඳපොළ තවදුරටත් සංවර්ධනය කිරීමට උදව් දීමෙන්;

(ඇ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සහ වෙනත් ව්‍යවසායන්හි ආයෝජනය කිරීම සඳහා දේශීය සහ විදේශීය මූලධනය එක්රැස් කිරීමෙන්; සහ

2—ඒ 37627—14,275 (78/11)

(ඇ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සංවර්ධනය සහ වෙනත් සංවර්ධනයන් සලස්වා එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය දියුණු කිරීමේ ලා නියැලීමෙන්.

(2) ස්වකීය අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, අනුමත ණය දෙන ආයතනවල සහභාගිත්වය හෝ සහයෝගය ඇතිව ක්‍රියා කළ හැකි සහ යෝග්‍ය කවර විටක වුව ද, බැංකුව විසින් එසේ ක්‍රියා කළ යුතු ය.

බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ ලා බැංකුවට ඇති බලතල.

6. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන බලතල සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ බැංකුව විසින් ක්‍රියාත්මක කළ හැකි ය:—

(අ) කර්මාන්තවල, කෘෂිකර්මයේ හෝ වාණිජ කටයුතුවල නියැලී සිටින හෝ නියැලීමට සූදානම්ව සිටින කවර වූ හෝ ව්‍යවසායකට ණය සහ අත්තිකාරම් දීම;

(ආ) අනුමත ණය දෙන ආයතනවලින් කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන් විසින් ලබා ගන්නා ලද හෝ ලබා ගැනීමට ඇති ණයවලට ඇප වීම;

(ඇ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්හි ප්‍රාග්ධන නිකුත් කිරීම් ප්‍රාරක්ෂණය කිරීමේ හේතුවෙන් ඇතිවන, මූල්‍ය ආයතනවල බැඳීම් වෙනුවෙන් ඇප වීම;

(ඈ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්හි ස්ථාවර පොලියක් රහිත ස්කන්ධවලට සහ කොටස්වලට සහභාගිවීම සහ එවැනි යම් ව්‍යවසායක ස්කන්ධ, කොටස්, බැඳුම්කර හෝ ණයකර නිකුත්කිරීම්වලට දායකවීම, ඒවා මිල දී ගැනීම හෝ ඒවා ප්‍රාරක්ෂණය කිරීම සහ එවැනි සුරැකුම්පත් විකිණීම සහ ගනුදෙනු කිරීම;

(ඉ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්ට අනුමත ණය දෙන ආයතන විසින් දෙන ලද සහ බැංකුව විසින් අනුමත කරන ලද වෙනත් ආයතනවලින් දෙන ලද ණය හෝ අත්තිකාරම් නැවත දීමේ මාර්ගයෙන් ණය හෝ අත්තිකාරම් දීම සහ ඒ කාර්යය සඳහා, ඒ බැංකු සහ ආයතන විසින් දෙන ලද ණය මුදල් පිළිබඳව කල් පිරීමේ උපරිම සහ අවම කාලසීමා නියම කිරීම;

(ඊ) බැංකුවේ අරමුණු සපුරාලන සහ බැංකුවේ කර්තව්‍යවලට අයත්වන ශිල්පීය සහ පරිපාලනමය උපදෙස් සහ සහාය වැනි සේවා කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසාය වලට සැලසීම;

(උ) බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමෙන් පසු ප්‍රථම අවුරුදු පහ ඇතුළත, මේ වගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් සේවාවන් සැපයීම සඳහා, ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දෙකක් නොඉක්මවන වියදමක්, ආපසු නොගෙවීමේ පදනමක් මත, දැරීම සහ ඉන්පසුව, අවශ්‍ය අවස්ථාවල දී, ආපසු නොගෙවීමේ පදනම මත, එකී සේවාවන් නොකඩවා සැලසීම සඳහා දරන ලද වියදම බැංකුවේ අරමුදලට වැයබර කිරීම;

(ඖ) බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී ද, බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද, කාර්යයන් කිරීමේ දී ද බැංකුවට සහායවීම සඳහා උපකාරක සමාගම් පිහිටුවීම ;

(එ) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායන් පිහිටුවීමට අනුබල දීම ;

(ඒ) යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ යම් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායන් අත්කර ගැනීම හෝ මිළ දී ගැනීම සහ එකී දේපළ හෝ ව්‍යවසාය කළමනාකරණය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා කටයුතු සැලැස්වීම සහ එකී දේපළ හෝ ව්‍යවසායන් විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම ;

(ඔ) බැංකුවේ අරමුදල් තාවකාලිකව විදේශීය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ඕ) අනුමත ණය දෙන ආයතන සමඟ ණයවලට, ස්ථාවර පොලියක් රහිත ස්කන්ධවලට සහ කොටස්වලට ප්‍රාරක්ෂණ වැඩ පිළිවෙලවල්වලට සහ ඇපවලට සහභාගිවීම ;

(ක) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායවල පැවරිය හැකි හෝ නොහැකි නැතහොත් ගනුදෙනු කළ හැකි හෝ නොහැකි, විනිමය පත්‍ර, පොරොන්දු නෝට්ටු, කූපන්, අණකර, ණයකර, සහතික, කොටස් සහතික පත්‍ර සහ වෙනත් සාධන පත්‍ර හා සුරැකුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, භාර ගැනීම, වට්ටම් කිරීම, නැවත වට්ටම් කිරීම, මිල දී ගැනීම, විකිණීම සහ ගනුදෙනු කිරීම ;

(ග) බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අත්හදා බැලීමේ ව්‍යාපෘති ඇතුළුව සංවර්ධන යෝජනා ක්‍රම ආරම්භ කිරීම ;

(ච) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ගුදම්, ගබඩා හා ගොඩනැගිලි තැනීමෙහි ලා නිරතවීම ;

(ජ) ගුදම්, ගබඩා හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වෙනත් බඩු බද්දට දීම, කුලියට දීම, විකිණීම හෝ කුලියට සින්නවීමේ පදනම මත විකිණීම ;

(ට) යම් කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායක් විසින් විවෘත වෙළෙඳපොළෙන් ලබාගන්නා ණයවලට ඇපවීම ;

(ඩ) යම් කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායකින් අය විය යුතු කල් තැබූ ගෙවීම්වලට ඇපවීම ;

(ණ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්ට බැංකුව විසින් දෙන ලද ණය සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ එවැනි ව්‍යවසායක් විසින් නිකුත් කරන ලද බැඳුම්කර හෝ ණයකර වෙනුවෙන් බැංකුව විසින් දෙන ලද දායක මුදල් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් කොටස් ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම ;

(ත) අනුමත ණයදෙන ආයතනයන්හි ස්කන්ධ, කොටස්, බැඳුම්කර, හෝ ණයකර නිකුත් කිරීම්වලට දායකවීම හෝ ඒවා මිල දී ගැනීම හෝ ඒවා ප්‍රාරක්ෂණය කිරීම ;

(ද) බැංකුව විසින් ඉටු කරනු ලැබිය හැකි කටයුතු සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි, කොමිස් මුදල්, තැරව් ගාස්තු, පොලී, පාරිශ්‍රමික හෝ ගාස්තු ලබා ගැනීම ;

(න) ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ යම් වාණිජ බැංකුවක හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක නැතහොත් මූල්‍ය ආයතනයක තැන්පත් ගිණුම් විවෘත කිරීම;

(ප) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන්නා වූ යම් කාල සීමා සඳහා සහ එසේ නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණ සඳහා කාල නියමයක් ඇති තැන්පතු කවර වූ හෝ තැනැත්තකුගෙන් භාර ගැනීම ;

(බ) ණයවර ලිපි සහ චක්‍රලේඛ සටහන් ප්‍රදානය කිරීම සහ නිකුත් කිරීම ;

(ම) රන් රිදී ගුළි සහ රන් රිදී කාසි මිලට ගැනීම, විකිණීම සහ ගනුදෙනු කිරීම සහ විනිමය පිළිබඳ කටයුතුවල නිරත වීම ; සහ

(ය) සාමාන්‍යයෙන්, මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ බැංකුව විසින් ක්‍රියාත්මක කළ යුතු බලතලවලට, කළ යුතු කාර්යවලට හෝ ඉටු කළ යුතු කර්තව්‍යවලට සම්බන්ධ වන්නා වූ හෝ ඒවා කර ගැනීමට ආධාර වන්නා වූ සියලු ක්‍රියා හෝ දේ කෙලින් ම හෝ අන් අයුරකින් කිරීම.

නිලධරයන්, බලය පවරාදීම්, ගිවිසුම් යනාදිය සම්බන්ධයෙන් බැංකුවේ විශේෂ බලතල.

7. මෙහි පහත දක්වෙන බලතල සියල්ලම හෝ ඉන් යමක් හෝ බැංකුව විසින් ක්‍රියාත්මක කළ හැකි ය :—

(අ) බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු, සාමාන්‍යාධිකාරිවරයකු පත් කිරීම ;

(ආ) බැංකුවේ වැඩ කර ගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ;

(ඇ) බැංකුවේ සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ සුභසාධක හා විනෝද ක්‍රීඩා පහසුකම්, නිවාස, නේවාසිකාගාර හා ඒ සමාන වෙනත් ඉඩකඩ සැපයීම ;

(ඈ) බැංකුවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී හෝ ඇතුල් වීම සහ ඒවා ඉටු කිරීම ;

(ඉ) බැංකුවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික, ඔවුන්ගේ විනය පාලනය, පැවැත්ම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ රීති සෑදීම ;

(ඊ) බැංකුවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(උ) බැංකුවේ කටයුතු නිසි ලෙස කර ගෙන යාම පහසු කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් සියලු දේ කිරීම.

8. (1) බැංකුවට පහත සඳහන් අයගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබිය යුතු ය :— අධ්‍යක්ෂ මණ්ඩලය.

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ තත් කාලයෙහි ලේකම් ධුරය දරන ("නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) තැනැත්තා ;

(ආ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් මණ්ඩලය විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක් ;

(ඇ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන ඒ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඈ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන ඒ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඉ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක් ;

(ඊ) ආණ්ඩුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ සහභාගිවන්නන් වෙතොත් ඔවුන් ද හැර, කොටස් හිමියන් විසින්, බැංකුවේ කොටස් ප්‍රාග්ධනයට ඔවුන්ගේ දායක මුදල බැංකුවේ ගෙවා නිමි මුළු ප්‍රාග්ධන යෙන් සියයට දහයට අඩු නොවේ නම්, තෝරා පත් කරනු ලබන (මේ පනතෙහි "තෝරා පත් කළ අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) තවත් එක් සාමාජික යෙක් :

එසේ වුව ද, කොටස් ප්‍රාග්ධනයට ඔවුන්ගේ දායක මුදල බැංකුවේ මුළු ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයට අඩු නම්, කොටස් හිමියන්ගේ සම්බන්ධතා නියෝජනය කිරීමට හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන වෙනත් සම්බන්ධතා නියෝජනය කිරීමට අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් නම් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) සිට (ඈ) දක්වා ඇති (ඒ ඡේද දෙකම ඇතුළුව) ඡේද යටතේ අධ්‍යක්ෂවරයන් ලෙස පත් කරනු ලබන තැනැත්තන් "පත් කළ අධ්‍යක්ෂවරු" යනුවෙන් ද, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ සහ (ඊ) ඡේදයේ අනුරු ඡේදය යටතේ අධ්‍යක්ෂවරු ලෙස නම් කරනු ලබන තැනැත්තන් "නම් කළ අධ්‍යක්ෂවරු" යනුවෙන් ද මේ පනතෙහි හඳුන්වනු ලැබේ.

(3) නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයා පැමිණ නොමැති නම්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ඒ සාමාජිකයාගේ විකල්ප සාමාජිකයා වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල දී ක්‍රියා කළ යුතු අතර එහි දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ද ඔහුට තිබිය යුතු ය.

(4) රෝගාතුරවීමේ හෝ වෙනත් අබලතාවයක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන්, පත් කළ අධ්‍යක්ෂවරයකුට හෝ නම් කළ අධ්‍යක්ෂවරයකුට තම ධුරයේ කාර්යයන් තාවකාලිකව ඉටු කළ නොහැකි වන අවස්ථාවක, ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල දී ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු පත්කිරීම හෝ නම් කිරීම, පත් කළ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් වන විට, පත්කිරීමේ බලධරයා විසින් ද, නම් කළ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් වන විට, අමාත්‍යවරයා විසින් ද කළ හැකි අතර ඒ තැනැත්තාට එකී රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ද හිමි විය යුතු ය.

(5) නම් කළ අධ්‍යක්ෂවරයකු, අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවැනි ඉවත් කිරීමක් ගැන කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(6) නම් කළ අධ්‍යක්ෂවරයකුට අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) නම් කළ අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය (6) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු හතරක් විය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය යනාදිය.

9. (1) බැංකුවේ කටයුතු සහ ව්‍යාපාර පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය, මෙහෙයවීම සහ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම ද මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ බැංකුව විසින් කළ හැකි සියලු ක්‍රියා සහ දේ කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ හැකි ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද, කර්තව්‍ය ඉටු කිරීමේ දී ද, කාර්ය කිරීමේ දී ද, මේ පනතේ විධිවිධානවලට යටත් ව, මනා ව්‍යාපාරික ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය; තව ද කර්මාන්තයේ, කෘෂිකර්මාන්තයේ සහ වාණිජයේ යහපත කෙරෙහි ද පොදුවේ මහජන යහපත කෙරෙහි ද නිසි සැලකිල්ල දැක්විය යුතු ය.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික.

10. අධ්‍යක්ෂවරුන් සියලු දෙනාට ම හෝ ඉන් යම් අධ්‍යක්ෂවරයකුට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් බැංකුවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

බැංකුව ඇතුළත් වීමට අදහස් කරන ගිවිසුමකට අධ්‍යක්ෂවරයකුගේ යම් සම්බන්ධතාවක් වේ නම් එය හෙළිදරව් කළ යුතු බව.

11. බැංකුව ඇතුළත්වීමට අදහස් කරන ගිවිසුමකට හෝ දීමට අදහස් කරන ණයකට කෙළින් ම හෝ අන් අයුරකින් යම් සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු වේ නම්, ඒ අධ්‍යක්ෂවරයා විසින් තමාගේ එකී සම්බන්ධතාවේ ස්වභාවය අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය. එසේ හෙළිදරව් කරන කරුණු ඒ රැස්වීමේ වාර්තාවට ඇතුළත් කළ යුතු අතර එකී ගිවිසුම හෝ ණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡාවක් හෝ තීරණයක් වේ නම්, ඒ සාකච්ඡාවට හෝ තීරණයට එකී අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම, ගණපූරණය සහ කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම.

**12.** (1) සෑම මාසයකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතු ය. තව ද ඊට අතිරේකව, මේ පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි රැස්වීම් පැවැත්විය යුතු ය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂ වරුන් හතර දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(3) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් තීරණය කෙරෙන කාර්ය පටිපාටියක් විය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල හා කාර්ය පවරා දීම.

**13.** (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය බලතල සහ කාර්ය අතුරින් යමක් බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයාට හෝ වෙනත් යම් සේවානියුක්තයකුට හෝ පවරා දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සෑම නියෝජිතයකු විසින් ම තමන් වෙත පැවරුණු බලය ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

පුරප්පාඩුවක් හෝ දෝෂයක් තිබියදීත් අධ්‍යක්ෂ මණ්ඩලයට ක්‍රියා කළ හැකි බව.

**14.** අධ්‍යක්ෂවරයකුගේ ධුරයක පුරප්පාඩුවක් හෝ අධ්‍යක්ෂ වරයකු නම් කිරීමේ දී වූ යම් දෝෂයක් හේතුකොට ගෙන පමණක්, අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසි ම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා.

**15.** (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික යන් අතුරින් සභාපතිවරයකු පත් කළ යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපති වරයාගේ ධුර කාලය, පත් කිරීමේ දිනයෙන් ආරම්භ වන වර්ෂ හතරක කාල සීමාවක් විය යුතු ය.

(3) සභාපතිවරයාගේ ධුර කාලය ඉකුත්වීමට පෙර ඔහුගේ ධුරය හිස් වුවහොත්, එසේ ධුරය හිස් කරන සභාපතිවරයාගේ ධුර කාල සීමාවේ ඉකුත් නොවූ කාලය තුළ ඔහු වෙනුවෙන් ධුරය දැරීමට වෙනත් තැනැත්තකු පත් කළ යුතු ය.

(4) කාලය ඉකුත්වීම නිසා සභාපති ධුරය හිස් කරන යම් තැනැත්තකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාපති වරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය. ඒ ඉවත් කිරීම ගැන කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(6) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ ඇති සාමාජිකයන් අතුරින් බහුතර සංඛ්‍යාවක් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසුන ඇරිය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන සභාපතිවරයාට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

බැංකුවේ මුද්‍රාව.

16. (1) බැංකුවේ මුද්‍රාව සාමාන්‍යාධිකාරීවරයාගේ භාරයේ තිබිය යුතු ය.

(2) බැංකුවේ මුද්‍රාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය.

(3) බැංකුවේ මුද්‍රාව සාමාන්‍යාධිකාරීවරයා හෝ වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නො තැබිය යුතු අතර, තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ සියලු දෙනාම ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය.

නියෝජිතයින් පත් කිරීම.

17. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව ඇතුළත සහ ඉන් පිටත බැංකුවේ නියෝජිතයන් පත් කළ හැකි ය.

(2) බැංකුව විසින් වෙනත් ආයතන වෙනුවෙන් ශ්‍රී ලංකාව ඇතුළත සහ ඉන් පිටත නියෝජිතයන් වශයෙන් කටයුතු කළ හැකි ය.

විශේෂ කමිටු පත් කිරීම.

18. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය කිරීමේ දී සහාය දීමේ සහ උපදෙස් දීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් විශේෂ කමිටුවක සාමාජිකයන් වශයෙන් පත්වීම් ලැබීමට සුදුසු තැනැත්තන් වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්, බැංකුවේ සේවකයන් හා එකී පත්වීම් ලැබීමට සුදුසුකම් ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් තැනැත්තන් ය. එවැනි යම් සාමාජිකයකුගේ ධුර කාලය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් විය යුතු ය.

විශේෂ කමිටුවල සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

19. යම් විශේෂ කමිටුවක සාමාජිකයකු වන බැංකුවේ සේවා නියුක්තයකු හැර, එවැනි විශේෂ කමිටුවක සාමාජිකයන්ට, ඒ කමිටුවේ රැස්වීම්වලට සහභාගිවීම වෙනුවෙන් හා ඔවුන්ගේ කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන්, තත් කාර්යය සඳහා සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ රීති මගින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික බැංකුවේ අරමුදල්වලින් ගෙවිය හැකි ය.

ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම.

20. 22 (1) වන වගන්තියේ සඳහන් මූලික දායක මුදල ගෙවනු ලබන තුරු බැංකුව විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ නොකළ යුතු ය :

එසේ වුව ද, ඊට කලින් දිනයක සිට බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් බලය දීම වළක්වන්නක් සේ මේ වගන්තියේ කිසිවක් සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම හෝ නොකළ යුතු ය.

## II වන කොටස

## මුදල්

**21.** බැංකුවේ බලය ලත් ප්‍රාග්ධනය, රුපියල් සියයේ කොටස් දෙකෝටියකට බෙදුණු රුපියල් දෙසිය කෝටියක් විය යුතු ය. බැංකුවේ ප්‍රාග්ධනය.

**22.** (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි වූ ප්‍රමාණවලින් සහ එසේ විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන්, පහත සඳහන් ආයතන විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා රුපියල් හැට කෝටියක මූලික දායක මුදලක් නියමිත දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ගෙවිය යුතු අතර එසේ දායක මුදල් ගෙවීමේ හේතුවෙන් ඒ ආයතන බැංකුවේ කොටස් හිමියන් ලෙස සලකනු ලැබිය යුතු ය :— බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායක මුදල්.

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව—මුදලින් රුපියල් හතලිස් කෝටියක් ;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව—මුදලින් රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් සහ ඉල්លූ විට ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවකින් රුපියල් හත්කෝටි පනස් ලක්ෂයක් ;

(ඇ) ලංකා බැංකුව—මුදලින් රුපියල් එක්කෝටි විසිපන්ලක්ෂයක් සහ ඉල්ලූ විට ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවකින් රුපියල් තුන්කෝටි හැත්තෑපන්ලක්ෂයක් ;

(ඈ) මහජන බැංකුව—මුදලින් රුපියල් එක්කෝටි විසිපත් ලක්ෂයක් සහ ඉල්ලූ විට ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවකින් රුපියල් තුන්කෝටි හැත්තෑපත් ලක්ෂයක්.

(2) බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක දී හෝ කාලවල දී ද එසේ තීරණය කරනු ලබන ප්‍රමාණයකින් හෝ ප්‍රමාණවලින් ද එසේ තීරණය කරනු ලබන ආකාරයෙන් ද, බැංකුව විසින් 21 වන වගන්තියේ සඳහන් කොටස් මහජනයා විසින් මිල දී ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු අතර ඒ කොටස් වෙන් කර දීම ද කළ යුතු ය.

(3) යම් කොටස් හිමියකුගෙන් හෝ සියලු කොටස් හිමියන් ගෙන් තවදුරටත් දායක මුදල් කලින් කල ඉල්ලා සිටීම ද, භාර ගැනීම ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ හැකි ය.

(4) මේ වගන්තියේ හෝ 57 වන වගන්තියේ හෝ විධිවිධාන අනුව හැර, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා යම් දායක මුදලක් ගෙවීම හෝ පිළිගැනීම හෝ නොකළ යුතු ය.

**23.** යම් කොටස් හිමියකුගේ වගකීම, ඔහුගේ කොටස් වෙනු වෙන් නොගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් වෙතොත්, ඒ මුදල් ප්‍රමාණයට සීමා විය යුතු ය. කොටස් හිමියන්ගේ වගකීම.

**24.** බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කර ගැනීම සඳහා ද එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය කිරීම සඳහා ද අවශ්‍ය වන මුදල්, මේ පනතේ මේ කොටසේ, මින් පසු ඇති විධිවිධාන යටතේ සහ ඒ විධිවිධානවලට අනුකූලව, බැංකුව විසින් ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පිටතින්, ණය වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලබා ගත හැකි ය. ණය ගැනීමට බැංකුවට ඇති සාමාන්‍ය බලතල.

ආණ්ඩුවෙන් ණය ලබා ගැනීම.

25. ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් කලින් කල ආණ්ඩුවෙන් ණය ලබාගත හැකි අතර ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් යම් මුදල් ප්‍රමාණයක්, ඒ නියමයන්ට සහ කොන්දේසි වලට යටත්ව, කලින් කල බැංකුවට ණයට දිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් තාවකාලික ලෙස ණය ගැනීම.

26. (1) මුදල් මණ්ඩලය විසින් ණය පිළිබඳ පොලිය සහ ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් නිශ්චය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් කලින් කල ශ්‍රී ලංකා මහ බැංකුවෙන් යම් මුදල් ප්‍රමාණ මාස හයක් නොඉක්මවන කාල සීමා සඳහා, තාවකාලික ලෙස ණයට ලබා ගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් ණයට ලබා ගන්නා මුදල් ප්‍රමාණය බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සහ නිදහස් සංචිතයෙන් සියයට දහයකට සමාන මුදලක් කිසිම අවස්ථාවක නොඉක්ම විය යුතු ය.

විදේශීය ආණ්ඩු ආදියෙන් ණය ගැනීම.

27. බැංකුව විසින්, මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව, කලින් කල යම් විදේශීය ආණ්ඩුවකින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කවර වූ හෝ වෙනත් යම් ප්‍රභවයකින් යම් මුදල් ප්‍රමාණයක්, එම මුදල පිළිබඳ පොලිය සහ එය ආපසු ගෙවීම සම්බන්ධයෙන් බැංකුව සහ අවස්ථාවෝචිත පරිදි එකී ආණ්ඩුව හෝ එකී වෙනත් ප්‍රභවය අතර වූ එකඟත්වයෙන් නිශ්චය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත, ණයට ගත හැකි ය.

ජාතික සංවර්ධන බැංකු ණයකර සහ ස්කන්ධ.

28. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණයකර සහ ස්කන්ධ ඇති කොට, නිකුත් කළ හැකි අතර එසේ ඇතිකොට නිකුත් කරනු ලබන ණයකර සහ ස්කන්ධ පිළිවෙලින් "ජාතික සංවර්ධන බැංකු ණයකර" සහ "ජාතික සංවර්ධන බැංකු ස්කන්ධ" යනුවෙන් මේ පනතෙහි හඳුන්වනු ලැබිය යුතු ය.

(2) ජාතික සංවර්ධන බැංකු ණයකර සහ ජාතික සංවර්ධන බැංකු ස්කන්ධ නිකුත් කිරීම, පැවරීම, ඒ පිළිබඳව කටයුතු කිරීම, ඒවා නිදහස් කිරීම සහ අවලංගු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව කළ යුතු ය.

ආපසු ගෙවීම ආදිය ගැන ආණ්ඩුව ඇප වන බව.

29. (1) (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇති කොට, නිකුත් කරන ලද ජාතික සංවර්ධන බැංකු ණයකරවල සහ ජාතික සංවර්ධන බැංකු ස්කන්ධවල ; සහ

(ආ) යම් විදේශීය ආණ්ඩුවකින් හෝ වෙනත් යම් ප්‍රභවයකින් මේ පනතේ මේ කොටස යටතේ බැංකුව විසින් ලබාගන්නා යම් ණයක

මුල් මුදල ආපසු ගෙවීම සහ ඒ මුල් මුදල වෙනුවෙන් පොලිය ගෙවීම ගැන ආණ්ඩුව විසින් ඇප විය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් ඇපවීමකින් නිදහස් වීම සඳහා අවශ්‍ය වූ යම් මුදලක් ඒකාබද්ධ අරමුදලට වැයබර කළ යුතු ය.

විදේශවලින් ලබාගන්නා ණය පිළිබඳව ආණ්ඩුව ඇපවීම.

30. (1) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයකින් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයකින් බැංකුව විසින් ලබා ගන්නා ලද යම් ණයක් වෙනුවෙන්, ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලබන නියම යන් හා කොන්දේසි මත ඇපවීමට ආණ්ඩුවට මෙයින් බලය පවරනු ලැබේ. මේ උපවගන්තිය යටතේ බලය ලැබී ඇත්තේ යම් ණයක් වෙනුවෙන් ඇපවීමට ද ඒ ණය පිළිබඳ වටිනාකම විදේශීය ව්‍යවහාර මුදලින් සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් ඇපවීමක් යටතේ ආණ්ඩුව විසින් ගෙවිය යුතු සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මෙයින් වැයබර කරනු ලැබේ.

(3) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයකින් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයකින් බැංකුවට දෙන ලද යම් ණයක මුල් මුදල සහ ඒ ණය වෙනුවෙන් වූ පොලිය සහ වෙනත් ගාස්තු සම්බන්ධ යෙන්, (1) වන උපවගන්තිය යටතේ වූ යම් ඇපවීමක් යටතේ බැංකුව විසින් ගෙවිය යුතු සියලු මුදල්, යම් ලිඛිත හෝ වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද,—

(අ) යම් ලිඛිත හෝ වෙනත් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට නියම කර ඇති හෝ මතුවට නියම කරනු ලබන හෝ යම් බද්දක්, තීරු ගාස්තුවක් හෝ ගාස්තුවක් වෙනුවෙන් කිසිම අඩුකිරීමක් නොකර සහ එවැනි යම් බද්දකින්, තීරු ගාස්තුවකින් හෝ ගාස්තුවකින් තොරව ; සහ

(ආ) යම් ලිඛිත හෝ වෙනත් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට පනවා ඇති හෝ මතුවට පනවනු ලබන සියලු සීමාකිරීම්වලින් තොරව

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ නේවාසික යම් පුද්ගලයකුට හෝ සංස්ථාවකට යම් බැඳුම්කරයක් හෝ පොරොන්දු නෝට්ටුවක් අර්ථදායී ලෙස අයිති වී ඇති අවස්ථාවක, ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයක් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයක් හැර, ඒ බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව දරන තැනැත්තකුට ඒ බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව යටතේ කරනු ලබන ගෙවීමක් සම්බන්ධයෙන් යම් බදුවලට, තීරු ගාස්තුවලට, ගාස්තුවලට හෝ පිළිබඳ මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, යම් පුද්ගලයකු හෝ සංස්ථාවක් ශ්‍රී ලංකාවේ නේවාසික ද නැතහොත් නිර්වාසික ද යන ප්‍රශ්නය 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 54 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) ආණ්ඩුව සහ මේ පනතට අනුව ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයක් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයක් අතර ඇති කරගත් සෑම ඇපවීමේ ගිවිසුමක් ම සහ එවැනි යම් ඇපවීමේ ගිවිසුමක් අනුව ආණ්ඩුව බැඳුණු සෑම ඇපවීමක් ම, යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, වලංගු වන අතර ඒවා පිළිබඳ ඒ ඒ නියමයන්ට අනුකූලව බලාත්මක කළ හැකි විය යුතු ය.

(6) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයක් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයක් විසින් බැංකුවට දෙනු ලැබූ සහ ආණ්ඩුව විසින් ඇප වූ යම් ණයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ණය ප්‍රකාශ කර ඇත්තේ හෝ සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවිය යුතු වන්නේ යම් ව්‍යවහාර මුදලකින් නැතහොත් ව්‍යවහාර මුදල්වලින් ද, ඒ ව්‍යවහාර මුදලට හෝ මුදල්වලට අදාළ වන සේ ශ්‍රී ලංකා රුපියල නැවත අගය කිරීමකින් සිදුවන යම් පාඩුවක් ආණ්ඩුව විසින් දැරිය යුතු අතර ඉන් ඇති වන යම් ලාභයක් ආණ්ඩුවට හිමි විය යුතු ය.

එකී සෑම පාඩුවක ම මුදල ඒකාබද්ධ අරමුදලට මෙයින් වැයබර කරනු ලැබේ.

(7) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයකින් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයකින් බැංකුව විසින් ලබා ගන්නා යම් ණයක් සම්බන්ධයෙන් බැංකුව විසින් ලියා අත්සන් කරන ලද කිසිම ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලේඛනයක් කවර හෝ ආකාරයක මුද්දර ගාස්තුවකට හෝ ගාස්තුවලට යටත් නොවිය යුතු අතර ඒ වෙනුවෙන් කවර හෝ ආකාරයක මුද්දර ගාස්තුවක් හෝ ගාස්තු අය නොකළ යුතු ය.

පාලිත ප්‍රභව අරමුදල.

31. (1) මේ පනතෙහි "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, "පාලිත ප්‍රභව අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් බැංකුව විසින් පිහිටු විය යුතු ය. ඒ අරමුදල බැංකුවේ පොදු අරමුදල්වල කොටසක් නොවිය යුතු අතර එය ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් විදේශීය ආණ්ඩුවක්, විදේශීය හෝ අන්තර්-ජාතික සංවිධානයක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා හෝ වෙනුවෙන් බැංකුවේ පොදු අරමුදලින් බාහිරව, බැංකුව විසින් පාලනය කළ යුතු විශේෂ අරමුදලක් විය යුතු ය.

(2) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායන්ට මේ පනතේ විධිවිධාන යටතේ සහ ඒ විධිවිධානවලට අනුකූලව මේ අරමුදලින් ණය, අත්තිකාරම් හෝ වෙනත් ණය පහසුකම් හෝ ආධාර දීම හෝ සැලසීම මේ අරමුදලේ අරමුණු විය යුතු ය.

(3) දායකයා සහ බැංකුව අතර එළඹුණු යම් ගිවිසුමක් අනුව යම් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායකට අරමුදලින් යම් ණයක්, අත්තිකාරමක්, ආධාරයක් හෝ වෙනත් ණය පහසුකමක් දීමට හෝ සැලසීමට බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

(4) අරමුදලේ කාර්ය සඳහා ආණ්ඩුව විසින් යම් විදේශීය ආණ්ඩුවක් විසින් සහ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් ප්‍රභවයක් විසින් ප්‍රදාන වශයෙන් සහ ආධාර වශයෙන් දෙනු ලබන සියලු මුදල් බැංකුව විසින් අරමුදලට බැර කළ යුතු ය. ඊට අතිරේකව, අරමුදල ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ශුද්ධ ආදායම හෝ පොලිය ද අරමුදලට බැර කළ යුතු ය.

(5) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ අදහසින් බැංකුව විසින් කරන ලද යම් ක්‍රියාවකින් හෝ දෙයකින් ඇතිවන හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් දරන ලද සියලු මූල්‍ය වගකීම් හෝ බැඳීම් අරමුදලට වැයබර කළ යුතු ය.

(6) අරමුදලේ අතිරික්තව ඇත්තා වූ ද අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වහාම ප්‍රයෝජනයට යෙදවිය නොහැක්කා වූ ද මුදල්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අරමුදලෙහි දීර්ඝකාලීන අභිවෘද්ධියට හානියක් නොමැතිව, යෝග්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකන සුරැකුම්පත්වල තාවකාලිකව ආයෝජනය කළ හැකි ය.

(7) මෙහි පහත දැක්වෙන කරුණු සියල්ල ම හෝ ඉන් යමක් සඳහා හෝ මේ පනත යටතේ රීති සෑදිය හැකි ය :—

(අ) අරමුදලේ ගිණුම් තබා ගත යුතු ආකාරය ;

(ආ) බොල් ණය සහ සැකසහිත ණය සඳහා සහ වත්කම්වල අගය ක්ෂය වීම සඳහා සහ සාමාන්‍ය බැංකු ව්‍යවහාරවලට අනුකූල වෙනත් අවිනිශ්චිත අවස්ථා සඳහා අරමුදලෙහි සංචිත පිහිටුවීම ;

(ඇ) අරමුදල අවසාන කිරීම හෝ වසා දැමීම ; සහ

(ඈ) ඉහත කී යම් කරුණකට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කරුණු.

(8) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, අරමුදලේ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බදු ගෙවීමෙන් බැංකුව නිදහස් විය යුතු ය.

32. (1) බැංකුව වෙත හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත— බැංකුවේ අරමුදල්.

(අ) බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායක මුදල් වශයෙන් ;

(ආ) බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී ;

(ඇ) බැංකුවේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය කිරීමේ දී ; සහ

(ඈ) බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී සහ පාලනය පවත්වා ගෙන යාමේ දී

ලැබෙන සියලු මුදල් බැංකුවේ අරමුදල්වලට බැර කළ යුතු ය.

(2) (අ) බැංකුවේ පරමාර්ථ හා අරමුණු ක්‍රියාත්මක කිරීම;

(ආ) බැංකුවේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය කිරීම; සහ

(ඇ) බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සහ පාලනය පවත්වාගෙන යාම

හේතුකොට ගෙන ඇති වන හෝ ඒ සම්බන්ධයෙන් දරන ලද බැංකුවේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු මූල්‍ය වගකීම් සහ බැඳීම් බැංකුවේ අරමුදල්වලට වැයබර කළ යුතු ය.

බැංකුවේ ලාභ යෙදවීම.

33. බැංකුවේ ලාභ—

(අ) පොදු සංචිතයක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ;

(ආ) බොල් හෝ සැක සහිත ණය සඳහා විශේෂ සංචිතයක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ;

(ඇ) නිශ්චිත කාර්ය සඳහා අවශ්‍ය වන වෙනත් යම් සංචිත අරමුදල් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ; සහ

(ඈ) ලාභාංශ ගෙවීමේ

කාර්ය සඳහා යෙදවිය යුතු ය.

බැංකුව ආදායම් බද්දෙන් නිදහස් බව.

34. බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලබන දිනයෙන් පසුව අවුරුදු දහයක කාලයක් ගතවන තුරු එහි ලාභ සහ ආදායම වෙනුවෙන් ආදායම් බදු ගෙවීමෙන් බැංකුව නිදහස් විය යුතු ය.

ණය ගැනුම්කරුගේ ලියාපදිංචි කළ ලිපිනය ආදිය.

35. (1) (අ) බැංකුව විසින් යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් දෙනු ලැබූ, හෝ

(ආ) බැංකුව විසින් යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් දෙනු ලැබූ තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් වූ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රයක් හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් ලැබූ හෝ ඒ බූදලය නියෝජනය කිරීම පිණිස පත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලුම් කරනු ලැබූ විට අධිකරණය විසින් ඒ සඳහා පත් කරනු ලැබූ, හෝ

(ඇ) යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් සඳහා ඇපයක් වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපළක යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් හිමිකර දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ පැවරී ඇති,

සෑම තැනැත්තකු ම වෙත එවනු ලබන සියලු ම දැන්වීම් යොමු කරනු ලැබිය හැකි ලිපිනයක් ඔහු විසින් බැංකුවේ ලියාපදිංචි කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන යම් තැනැත්තකු වෙත භාර දීමට නියමිත යම් දැන්වීමක්, ඒ උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයට ලියාපදිංචි කළ

ලිපියකින් තැපැලෙන් ඔහු වෙත යවනු ලැබුවහොත් එය ඒ තැනැත්තා වෙත විධිමත් ලෙස භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතු අතර සාමාන්‍ය තැපැලෙන් ලියුම භාර දෙනු ලැබිය හැකි වේලාවේ දී භාරදීම කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තම ලිපිනය ලියාපදිංචි කිරීම පැහැර හරින අවස්ථාවක, බැංකුව විසින් ඔහු වෙත අමතා දැන්වීමක් ගැසට් පත්‍රයේ හා යටත් පිරිසෙයින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දිනපතා පළ කෙරෙන පුවත්පත් තුනක පළ කළ යුතු අතර, ඒ දැන්වීම අන්තිමට පළ කරනු ලැබූ දවසේ ඔහු වෙත ඒ දැන්වීම විධිමත් ලෙස භාරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

බැංකුව විසින් ණය ආදිය දිය හැක්කේ කවර ඇප පිට ද යන වග.

**36.** බැංකුව විසින්—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක උකසක්;

(ආ) ජාතික සංවර්ධන බැංකු ණයකර සහ ජාතික සංවර්ධන බැංකු ස්කන්ධ හැර යම් ස්කන්ධ, ඇපකර, ණයකර, කොටස්, උකස් පැවරුම් හෝ වෙනත් සුරැකුම්පත්;

(ඇ) යම් ගුදම් ලදුපත්, නෞභාර පත්, හෝ ඇප පිළිබඳ කාර්යය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලබන වෙනත් සාධන පත්‍ර;

(ඈ) යම් බඩු, ගුදම් බඩු හෝ වෙළෙඳ බඩු; හෝ

(ඉ) යම් ව්‍යවසායක් හෝ පුද්ගලයකු විසින් දෙනු ලැබ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලැබූ යම් ඇපවීමක්

ඇපය වශයෙන් තබාගෙන, යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් දෙනු ලැබිය හැකි ය.

ගෙවීම පැහැර හැරීම.

**37.** යම් නිශ්චල දේපළක උකසක් පිට බැංකුව විසින් දෙනු ලැබූ යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් ආපසු ගෙවීමේ දී වාරිකයක් වශයෙන් ගෙවිය යුතු හෝ ඒ ණය, අත්තිකාරම හෝ ණය පහසුකම වෙනුවෙන් වූ පොලිය වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීමෙහි ලා පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක, බැංකුවට ආපසු ගෙවනු නොලැබූ ඒ ණයේ, අත්තිකාරමේ හෝ ණය පහසුකමේ කොටස හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු පොලිය සම්බන්ධයෙන් පැහැරහැරීමක් කරන ලද සේ සැලකිය යුතු ය.

ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියා කිරීම.

**38.** (1) යම් ණයක ආපසු ගෙවනු නොලැබූ කොටස හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු පොලිය ගෙවීම මේ පනතේ විධිවිධාන යටතේ පැහැර හරිනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම අභිමතය පරිදි 39 වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ දක්වා ඇති පරිදි ක්‍රියා කළ හැකි ය:

එසේ වුව ද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 39 වන වගන්තිය අනුව ක්‍රියා කර ඇති හෝ ක්‍රියා කිරීමට ආරම්භ කිරීමෙන් පසුව, 41 වන වගන්තිය යටතේ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් ඒ අවස්ථාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය යයි හෝ නුවණට හුරු යයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකන්නේ නම්, මණ්ඩලය විසින් එසේ කිරීම කිසිම විටක කිසිවකින් නොවැළැක්වෙන බව සැලකිය යුතු ය.

(2) මේ වගන්තියේ සහ 39 වන වගන්තියේ සිට 53 වන වගන්තිය තෙක් වූ වගන්තිවල කාර්ය සඳහා "ණය" යන පදයෙන් බැංකුව විසින් දෙන ලද ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් අදහස් වේ.

උකස් කරනු ලැබූ දේපළක සන්තකය භාර ගැනීම සඳහා කළමනාකරුව බලය පැවරීම.

39. පැහැර හැරීම කරනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපළකට ඇතුළු වී, ඒ දේපළෙහි සන්තකය භාර ගැනීමට ද එය කළමනාකරණය කිරීමට හා නඩත්තු කිරීමට ද උකස්කරු විසින් පැහැර හැරීම කරනු නොලැබුවේ නම් ඔහු විසින් ඒ දේපළ පාලනය කිරීමේ ලා හා කළමනාකරණය කිරීමේ ලා ක්‍රියාත්මක කළ හැකිව තිබූ බලතල, ඒ දේපළ පාලනය කිරීමේ ලා හා කළමනාකරණය කිරීමේ ලා ක්‍රියාත්මක කිරීමට ද 42 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, ලියවිල්ලකින් වාර්තාගත කරනු ලැබිය යුතු යෝජනා සම්මතයක සඳහන් කරනු ලබන යම් තැනැත්තකුට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ යෝජනා සම්මතය මගින් බලය පැවරිය හැකි ය.

කළමනාකරු පත් කළ විට කාර්ය පටිපාටිය.

40. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් යම් දේපළක් සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ බලය පවරනු ලබන යම් තැනැත්තකුට ඒ යෝජනා සම්මතය අනුව සාමාන්‍යයෙන් ක්‍රියා කිරීමට සහ විශේෂයෙන් ම—

(අ) ඒ දේපළෙහි පලදාව විකිණීමට ;

(ආ) ඒ දේපළෙන් කුලී, ලාභ හෝ වෙනත් ආදායම් ලැබීමට ;

(ඇ) ඒ දේපළ පාලනය කිරීමේ ලා හා කළමනාකරණය කිරීමේ ලා දැරීමට සිදුවන වියදම් ඒ දේපළින් ලැබෙන ආදායමින් ගෙවීමට ;

(ඈ) ඔහුගේ සේවාවන් සඳහා පාරිශ්‍රමික වශයෙන් සුදුසු යයි මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් මුදලක් වෙතොත්, ඒ මුදල ආදායමෙන් තමා වෙත නතු කර ගැනීමට ; සහ

(ඉ) ඒ දේපළ පිළිබඳ උකස යටතේ බැංකුවට අය විය යුතු සියලු ම මුදල් සම්පූර්ණයෙන් ම ගෙවා නිම වන තුරු හෝ (2) වන උපවගන්තිය යටතේ ඒ දේපළෙහි සන්තකය භාර දෙන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුට විධාන කරන තුරු හෝ ඒ දේපළෙහි සන්තකය දැරීමට ද

හිමිකම් තිබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් යම් දේපලක් සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ සෑම තැනැත්තකු ම විසින්—

(අ) උකස්කරුගේ නඩත්තුව සඳහා මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි යම් මුදලක් නියම කරනු ලැබුවහොත්, ඒ මුදල ඒ දේපලෙහි ආදායමෙන් උකස්කරුට මාස්පතා ගෙවිය යුතු ය;

(ආ) මෙහි මින් පෙර බලය පවරනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපලේ ආදායමෙන් ඉතිරිවන මුදල යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු ලෙස මණ්ඩලය විසින් විධාන කරනු ලබන්නේ ද, ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට මණ්ඩලය විසින් විධාන කරනු ලබන ආකාරයකින් තෙමසකට වරක් හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන වෙන යම් ක්‍රමයකට හෝ ඒ මුදල ගෙවිය යුතු ය;

(ඇ) ඒ දේපල සම්බන්ධයෙන් තමාට ලැබුණු හා තමා විසින් ගෙවන ලද සියලු ම මුදල් පිළිබඳව පැහැදිලි වූත් නිවැරදි වූත් වාර්තා තබා ගත යුතු අතර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් අන්තර් කාලවල දී මණ්ඩලය වෙත ඒ වාර්තා ඉදිරිපත් කළ යුතු ය;

(ඈ) ඒ දේපලෙහි සන්තකය උකස්කරුට හෝ වෙන යම් තැනැත්තකුට ඒ සන්තකය භාර දෙන ලෙස මණ්ඩලය විසින් විධාන කරනු ලබන්නේ ද, ඒ තැනැත්තාට භාර දිය යුතු අතර මෙහි මින් පෙර බලය පවරනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපලෙහි ආදායමෙන් යම් මුදලක් තමා වෙත ඉතිරිව ඇත්නම් ඒ මුදල මණ්ඩලයට ගෙවිය යුතු ය.

(3) උකස යටතේ බැංකුවට අය විය යුතු සියලු ම මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිම වූ විට, මණ්ඩලය විසින් උකස් දේපලෙහි සන්තකය උකස්කරුට ආපසු දිය යුතු අතර ඒ දේපලේ ආදායමෙන් යම් මුදලක් ඉතිරිව ඇත්නම් ඒ මුදල ද ඔහුට දිය යුතු ය.

උකස් දේපල විකිණීම සඳහා බලය පැවරීම.

41. පැහැර හැරීම කරනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපලක්, ඒ ණයෙන් නොගෙවා ඇති කොටස හා විකිණීමේ දිනය දක්වා ඒ වෙනුවෙන් අය විය යුතු පොලිය, 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් හා වියදම් ද සමග, අය කර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, ලියවිල්ලකින් වාර්තාගත කළ යුතු යෝජනා සම්මතයක සඳහන් යම් තැනැත්තකුට අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 42 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ යෝජනා සම්මතය මගින් බලය පැවරිය හැකි ය.

ණයගැනුම්කරු මිය ගොස් ඇති අවස්ථාවක.

42. (1) ණයගැනුම්කරු මිය ගොස් ඇති විටක වුව් ද නැතහොත් ණය සඳහා ඇපය වශයෙන් උකස් කරන ලද දේපල පිළිබඳ කවර ආකාරයේ වූ හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් හිමිකර දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් වෙනත් යම් තැනැත්තකු වෙත පැවරී ඇති විටක වුව ද, (2)

වන උපවගන්තියෙහි අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, 39 වන සහ 41 වන වගන්තිවල විධිවිධාන යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ණයගැනුම්කරු මිය ගොස් ඇත්තා වූ ද ඔහුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කර නොමැති වූ ද අවස්ථාවක, කොළඹ දිසා අධිකරණය විසින් හෝ ඒ දේපළ පිහිටි ස්ථානය පිළිබඳ අධිකරණ බලය ඇති දිසා අධිකරණය විසින් හෝ මේ වගන්තියේ කාර්ය සඳහා, ණයගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලීමක් කළ විට හා ඒ ඉල්ලීම පිළිබඳ දැන්වීමක් භාර දෙනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලබන තැනැත්තන් ඇතොත් ඔවුන්ට ඒ දැන්වීම භාර දීමෙන් පසු හා ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කිරීම නොනිසි ලෙස ප්‍රමාද වීමට ඉඩ තිබෙන බවට අධිකරණය සෑහීමට පත් වුව හොත් එසේ මේ වගන්තියේ කාර්ය සඳහා, ණයගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත් කළ හැකි ය; තව ද, ඒ ණයගැනුම් කරුගේ බූදලය නියෝජනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ තැනැත්තකු පත් කළ හොත් මිස හා පත් කරනු ලබන තුරු 39 වන සහ 41 වන වගන්තිවල විධිවිධාන ඒ ණයගැනුම්කරු විසින් කරන ලද යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

*උකස් දේපළක් විකිණීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම.*

43. යම් දේපළක් විකිණීමට බලය පවරන්නා වූ 41 වන වගන්තිය යටතේ වූ සෑම යෝජනා සම්මතයක් ම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි ද, යටත් පිරිසෙයින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වන්ගෙන් දිනපතා පළ කෙරෙන පුවත් පත් තුනක ද පළ කළ යුතු අතර ඒ දැන්වීමෙහි පිටපත් ණයගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම්, ඔහු වෙත ද, 35 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධ යෙන් තම ලිපිනය ලියාපදිංචි කර සිටින සෑම තැනැත්තකු වෙත ද යැවිය යුතු ය.

*විකිණීම පිළිබඳ දැන්වීම.*

44. සෑම විකිණීමක් ම පිළිබඳ දිනය ද, වේලාව සහ ස්ථානය ද ඒ විකිණීම සඳහා නියම කරනු ලැබූ දින සිට දින දහහතරකට නො අඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය. තව ද, ඒ දැන්වීමෙහි පිටපත්—

(අ) ණයගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම්, ඔහු වෙත ද, යම් යෝජනා සම්මතයක් පිළිබඳව දැන්වීමක් 43 වන වගන්තිය යටතේ දිය යුතු ලෙස නියමිත සෑම තැනැත්තකු ම වෙත ද භාර දිය යුතු ය;

(ආ) විකිණීමට ඇති දේපළ මත හෝ ඒ අසල ඇලවිය යුතු ය; තවද

(ඇ) දේපළ පිහිටා ඇත්තේ යම් කච්චේරියක සහ යම් දිසා අධිකරණවල සහ මහෙස්ත්‍රාත් අධිකරණවල බලසීමාව තුළ ද ඒ කච්චේරියේ, දිසා අධිකරණවල හා මහෙස්ත්‍රාත් අධිකරණවල බිත්ති මත ඇලවිය යුතු ය.

**45.** (1) ණයේ ආපසු ගෙවනු නොලැබූ කොටස සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි යම් මුදල් සහ ගාස්තු කිසිවක් වෙතොත්, ඒ මුදල්වල සහ ගාස්තුවල ප්‍රමාණය ද (උකස පිළිබඳ නියම අනුව ඒ කොටස වෙනුවෙන් අය විය යුතු සියලු පොලී ද සමග) එකී දේපළ විකිණීමට නියමිත දිනට පෙර යම් වේලාවක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුව හොත්, දේපළ නොවිකිණිය යුතු අතර 41 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය අනුව ඒ දේපළ විකිණීම සඳහා කිසිම වැඩිදුර පියවරක් ද නොගත යුතු ය.

විකිණීමට පෙර මුදල් ගෙවීම.

(2) ගෙවීම පැහැර හරිනු ලැබූ වාරිකයෙහි හෝ වෙනත් ගෙවීමෙහි ප්‍රමාණය සහ උකස පිළිබඳ නියම අනුව ඒ වෙනුවෙන් අය විය යුතු පොලියක් වෙතොත් එය ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් සහ ගාස්තු කිසිවක් වෙතොත් ඒ මුදල්වල සහ ගාස්තුවල ප්‍රමාණය ද දේපළ විකිණීමට නියමිත දිනට පෙර යම් වේලාවක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරි පත් කරනු ලැබුවහොත්, ඒ දේපළ නොවිකිණිය යුතු බවට සහ 41 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය අනුව ඒ දේපළ විකිණීම සඳහා කිසිම වැඩිදුර පියවරක් නොගත යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම අභිමතය අනුව විධාන කළ හැකි ය.

**46.** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරම්භක ලංසුවක් නියම කළ හැකි අතර බැංකුවට හැර, වෙනත් යම් තැනැත්තකුට ඒ දේපළ ඒ ආරම්භක ලංසුවට අඩු ලංසුවකට නොවිකිණිය යුතු ය.

ආරම්භක ලංසුව.

**47.** එකම දේපළක් ඇපය වශයෙන් තබා ගෙන බැංකුව විසින් ණය දෙකක් හෝ ඊට වැඩි ගණනක් දෙනු ලැබ ඇත්තා වූ හා ඒ ණයවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් වෙනුවෙන් අයවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇත්තා වූ යම් අවස්ථාවක, අනික් ණය සම්බන්ධයෙන් හෝ අනික් ණයවලින් කිසිවක් සම්බන්ධයෙන් පැහැර හැරීමක් කර නොතිබුණ ද, මේ පනතෙහි පෙරාතුව වූ විධි විධාන අදාළ විය යුතු ය. තව ද එවැනි යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ණය දෙක ම හෝ ණය සියල්ල ම සම්බන්ධ යෙන් බැංකුවට අය විය යුතු සම්පූර්ණ මුදල අය කර ගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 41 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින් ඒ දේපළ විකිණීමට බලය පැවරිය හැකි අතර මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

එකම දේපළක් ඇපය වශයෙන් තබා ලබා ගත් නා ලද ණය කිහිපයක් අතුරින් එක් ණයක් සම්බන්ධ යෙන් ගෙවීම් පැහැර හැරීම.

**48.** යම් ණයක් වෙනුවෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණයට අතිරේකව පහත දක්වෙන මුදල් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය ගැනුම්කරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු ගෙන් අය කර ගත හැකි ය—

බැංකුව විසින් දරන ලද වියදම් සහ ගාස්තු අයකර ගැනීම.

(අ) බැංකුවට උකස් කරන ලද දේපළ විෂයයෙහි ලබා ගත් යම් රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් වූ වාරික හා වෙනත් අයකිරීම් ද ණය ලබාගත් තැනැත්තා විසින් ලියා අත්සන් කරන ලද උකස්කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්ති යටතේ, බැංකුව විසින් දරනු ලැබීමට බලය පැවරී ඇති වෙනත්

සියලු ගාස්තු හා අය කිරීම් ද ගෙවීමෙහි ලා ඒ උකස්කර යෙහි ඇතුළත් ප්‍රතිඥප්තිවලට අනුකූලව බැංකුව විසින් වියදම් කරන ලද සියලු මුදල් ; සහ

(ආ) විකිණීම ප්‍රචාරය කිරීමේ සහ උකස් දේපළ විකිණීමේ ගාස්තු :

එසේ වුව ද මේ ඡේදය යටතේ දරනු ලබන ගාස්තු මණ්ඩලය විසින් කලින් කල යෝජනා සම්මතයකින් නියම කරනු ලබන ණයෙහි ප්‍රතිශතයක් නොඉක්මවිය යුතු ය.

අතිරික්ත ශේෂය ගෙවීම.

**49.** උකස් දේපළ විකුණනු ලැබුවහොත්, උකස වෙනුවෙන් අය විය යුතු මුදල සහ 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් හා ගාස්තු විකිණීමෙන් ලැබුණු මුදලෙන් අඩු කර ගැනීමෙන් පසු, යම් මුදලක් ඉතිරි වුවහොත් ඒ ඉතිරි මුදල, ණය ගැනුම්කරුට හෝ ණයගැනුම්කරුට ලැබිය යුතු ගෙවීම් භාර ගැනීමට නීත්‍යනුකූලව හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ කවරකුට ඒ මුදල ගෙවිය යුතු දැයි යන්න ගැන අධ්‍යක්ෂ මණ්ඩලයට සැක යක් ඇති විට, උකස් දේපළ පිහිටි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙවිය යුතු ය.

විකුණුම් සහතිකය.

**50.** (1) උකස් දේපළ විකුණනු ලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චිත වශයෙන් දෙනු ලැබූ බලයක් පිට සාමාන්‍යාධිකාරීවරයා විසින් විකුණුම් සහතිකයක් නිකුත් කළ යුතු ය ; එවිට ණයගැනුම්කරුට ඒ දේපළට හෝ ඒ දේපළ පිළිබඳව ඇති සියලු අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතාවන් ගැනුම්කරුට අත්විය යුතු ය ; ඉන් පසු, ඒ දේපළ බැංකුවට උකස් කළ දිනයෙන් පසුව, ණයගැනුම්කරුට ඒ දේපළට හා ඒ දේපළ පිළිබඳව ඇති අයිතිවාසිකම්, හිමිකම් හෝ සම්බන්ධතාවන් පිළිබඳව කරන ලද හෝ ලියාපදිංචි කරන ලද කවර ආකාරයේ වූ හෝ යම් බැහැර කිරීමක් මගින් හෝ ඒ යටතේ හෝ හිමිකම් පාන යම් තැනැත්තකු විසින් කවර හෝ හේතුවක් නිසා, ඒ විකිණීම අවලංගු කරන ලෙස යම් අධිකරණය කදී ඉල්ලා සිටීමට හෝ ගැනුම්කරුට ප්‍රතිපක්ෂව ඒ දේපළට හෝ ඒ දේපළ පිළිබඳව ඇති යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් තමාට ඇති බව තහවුරු කිරීමට හෝ නොහැකි විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාමාන්‍යාධිකාරීවරයා විසින් අත්සන් කරන ලද සහතිකයක්, යම් දේපළක් විකිණීම සම්බන්ධයෙන් මේ පනතේ සියලු විධිවිධාන අනුව ක්‍රියා කර ඇති බවට ඒ දේපළ විකිණීම සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(3) ගැනුම්කරු බැංකුව නොවන වෙනත් තැනැත්තකු නම්, විකුණුම් සහතිකය මේ පනතේ උපලේඛනයෙහි ඇති 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු ය ; ගැනුම්කරු බැංකුව නම්, ඒ සහතිකය මේ පනතේ උපලේඛනයෙහි ඇති 'ආ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(4) සෑම විකුණුම් සහතිකයක් ම, එය නිශ්චල දේපළ පිළිබඳ හිමිකරයක් වූවාක් මෙන්, නියමිත මුද්දර ගාස්තුවට හා අයකිරීම් වලට සහ අයකිරීමට නීතියෙන් බලය පැවරී ඇති ලියාපදිංචි කිරීමේ ගාස්තුවලට සහ වෙනත් අයකිරීම්වලට යටත් විය යුතු ය; ඒ සියලුම ගාස්තු හා අයකිරීම් ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

51. (1) මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපළක ගැනුම්කරු විසින් කොළඹ දිසා අධිකරණය වෙත හෝ ඒ දේපළ පිහිටි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය දරන දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට හා ඒ දේපළ සම්බන්ධයෙන් 50 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විකුණුම් සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ දේපළේ සන්තකය භාර දීම සඳහා වූ ආඥාවකට ඔහු හිමිකම් ලැබිය යුතු ය. සන්තකය භාරදීමේ ආඥාව.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම, ඉදිරිපත් කිරීම ද ඒ පිළිබඳ සුදුසු කටයුතු කිරීම ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ලඝු කාර්ය පටිපාටිය අනුව කළ යුතු ය; තව ද ඒ එක් එක් ඉල්ලීමේ කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන වෙනුවෙන් ද ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන සියලු නඩු කටයුතු වෙනුවෙන් ද, ඒ ඉල්ලීම අදාළ වන දේපළෙහි වටිනාකම ම ඇති නිශ්චල දේපළක සන්තකය භාර දීම සඳහා දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවෙහි යොදවන ලෙස කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් හා ඒවා ක්‍රියාවෙහි යෙදවීම හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික නඩු කටයුතු වෙනුවෙන් තත්කාලයෙහි වලංගුව පවතින යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු ඒ ඒ ගාස්තු ප්‍රමාණයන් අනුව මුද්දර ගාස්තු ද වෙනත් අයකිරීම් ද ගෙවිය යුතු ය.

(3) ණයකරු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු හෝ බැංකුවට දේපළ උකස් කරනු ලැබීමෙන් පසුව ණයකරු විසින් ඇති කරන ලද හිමිකමක් යටතේ හිමිකම් පාන යම් තැනැත්තකු හෝ මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපළක පදිංචිව සිටින අවස්ථාවක ගැනුම්කරුට හෝ ඔහු වෙනුවෙන් සන්තකය භාර ගැනීමට ඔහු විසින් පත් කරනු ලබන යම් තැනැත්තකුට හෝ දේපළෙහි සන්තකය දීමෙන් භාර දීම කරන ලෙස දිසා අධිකරණය විසින් ආඥාවක් කළ යුතු ය.

(4) කුලී නිවැසියකු හෝ එහි පදිංචි වීමට හිමිකම් ඇති වෙනත් තැනැත්තකු හෝ මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපළක පදිංචිව සිටින අවස්ථාවක, විකිණීම කර ඇති බවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් වූ දැන්වීමක් දේපළෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමෙන් ද ණයකරුගේ සම්බන්ධතාව ගැනුම්කරුට පවරා තිබෙන බව යම් පහසු ස්ථානයක අණබෙර ගැස්වීමෙන් හෝ ව්‍යවහාරයෙහි පවතින වෙනත් යම් ක්‍රමයකින් හෝ පදිංචිකරුට ප්‍රකාශ කිරීමෙන් ද භාරදීම කරන ලෙස දිසා අධිකරණය විසින් ආඥා කළ යුතුය. එසේ ප්‍රකාශ කිරීමේ ගාස්තු අධිකරණය විසින් නියම කළ යුතු අතර සෑම අවස්ථාවක දී ම ගැනුම්කරු විසින් ඒ ගාස්තු කලින් ගෙවිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ වූ සෑම ආඥාවක් ම, අවස්ථාවෝචිත පරිදි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන වගන්තිය යටතේ හෝ 288 වන වගන්තිය යටතේ හෝ කරන ලද සන්තකය භාර දීම සඳහා වූ ආඥාවක් ලෙස සැලකිය යුතු අතර, ඒ නඩු විධාන සංග්‍රහයෙහි යම් විධිවිධානයක් අදාළ කිරීමේ කාර්යය සඳහා, ණයකරු සහ ගැනුම්කරු පිළිවෙළින් විනිශ්චිත ණයකරු සහ විනිශ්චිත ගැනුම්කරු වශයෙන් සලකමින්, ඒ ආඥාව එසේ 287 වන හෝ 288 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ම බලාත්මක කළ හැකි ය.

විකිණීම අවලංගු කිරීම.

52. විකුණන ලද දේපළ බැංකුව වෙනුවෙන් මිලයට ගෙන ඇති අවස්ථාවක, ඒ දේපළ විකුණන ලද්දේ යම් ණයක් වෙනුවෙන් ද ඒ ණය සම්බන්ධයෙන් (තහනමට ගැනීමේ හා විකිණීමේ වියදම් ද ඇතුළුව) ගෙවිය යුතු මුදල් සහ නියමිත ප්‍රමාණය නොඉක්මවිය යුතු ප්‍රමාණයන් අනුව මුළු මුදල වෙනුවෙන් වූ පොලිය ණයකරු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ කල්හි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ දේපළ නැවත විකුණනු ලැබීමට පෙර යම් වේලාවක දී විකුණුම් සහතිකයෙහි සහතික පිටපතක විකිණීම අවලංගු කරන බවට පිටසනක් සාමාන්‍යාධිකාරීවරයා විසින් කරන ලද විට, විකිණීම අවලංගු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය හැකි ය. ඒ පිටසන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට මේ පනත යටතේ වූ විකිණීම සිදු නොවූවාක් සේ ඉන් එකී දේපළ ණයකරු වෙත නැවත සතු විය යුතු ය.

බැංකුව විසින් නැවත විකිණීම.

53. එසේ විකුණන ලද දේපළ බැංකුව වෙනුවෙන් මිලට ගෙන තිබේ නම් හා ඒ විකිණීම 52 වන වගන්තිය යටතේ අවලංගු කරනු නොලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කවර හෝ වේලාවක දී, ඒ දේපළ නැවත විකුණා, මුල් විකිණීමේ දී ගැනුම්කරුට අත් විය හැකිව තිබූ සියලු අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතාවන්, 50 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ සහතික පිටපතක සාමාන්‍යාධිකාරිවරයා විසින් පිටසනක් කිරීමෙන් ඒ ගැනුම්කරුට පවරා දිය හැකිය. එකී පිටසන මුල් විකිණීමේ දී ගැනුම්කරුට නිකුත් කරනු ලබන සහතිකයක් වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුවට ම සහ අයකිරීම්වලට ම යටත් විය යුතු අතර ඒ පිටසන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට ඉහත කී අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතාවන් ඉන් ගැනුම්කරුට අත් විය යුතු ය.

## III වන කොටස

### විගණනය හා ගිණුම්

බැංකුවේ මුදල් වර්ෂය.

54. බැංකුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

විගණනය.

55. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන දොළොස් මාසයක් වූ කාලයක් නොඉක්මවන කාලාන්තරවල දී විගණකාධිපතිවරයා විසින් බැංකුවේ ගිණුම් විගණනය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, බැංකුවේ ගිණුම් විගණනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින්, විගණකාධිපතිවරයා විමසා, සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කළ හැක්කේ ය. එවැනි පත් කිරීමක් අමාත්‍ය වරයා විසින් කරනු ලැබූ විට, ඒ බැංකුව සම්බන්ධයෙන් විගණකාධි පතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය කිරීම හා ඉටු කිරීම සඳහා විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවය ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව විගණකාධිපතිවරයා විසින් ඒ විගණකවරයාට හෝ විගණකවරයන්ට ලියවිල්ලකින් දැන්විය හැකි අතර එසේ දන්වනු ලැබූ විට ඒ විගණකවරයා හෝ විගණක වරයන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකු ම විසින් තම වාර්තාව අමාත්‍ය වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපති වරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

(4) විගණකාධිපතිවරයා විසින් බැංකුවේ ගිණුම් පරීක්ෂා කොට, ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව නිසැකව දැන ගෙන—

(අ) තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් තමා ලබාගත්තේ ද, නොගත්තේ ද යන වග ද;

(ආ) වාර්තාවේ සඳහන් ශේෂ පත්‍රය, තමාට ලැබී ඇති තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ බැංකුවේ පොත්පත්වල දක්වා ඇති පරිදි බැංකුවේ කටයුතු, තමාගේ මතය අනුව, සත්‍ය හා නිවැරදි ආකාරයෙන් පෙන්නුම් කෙරෙන ලෙස නිසි පරිදි පිළියෙල කර තිබේ ද යන වග ද

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය.

(5) ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව නිසැකව දැන ගැනීම පිණිස විගණකාධිපතිවරයා විසින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අමාත්‍ය වරයාගේ අනුමතය ඇතිව, බැංකුවේ යම් ශාඛාවක් සම්බන්ධයෙන්, බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇති සහ සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ බැංකුවේ නිලධරයකු විසින් නිරවද්‍ය බවට සහතික කොට ඇති ඒ ශාඛාවේ පොත්පත්වල සහ ගිණුම්වල පිටපත් හෝ උධෘත පිළිගත හැකි ය.

(6) මේ වගන්තියේ " සුදුසුකම් ලත් විගණකවරයා " යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරී වරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතන යේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද

එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තී යෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ලේඛන අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව.

**56.** (1) යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ වර්ෂය සම්බන්ධ යෙන් මෙහි පහත සඳහන් එක් එක් ලේඛනයේ පිටපතක් අමාත්‍ය වරයා වෙත සහ සියලුම කොටස් හිමියන් වෙත යැවීමට සැලැස්විය යුතු ය:—

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව;

(ආ) ශේෂ පත්‍රය;

(ඇ) ලාභ සහ අලාභ ගිණුම; සහ

(ඈ) බැංකුවේ වැඩකටයුතු පිළිබඳව විස්තර කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාගේ වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ලැබුණු ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

## IV වන කොටස

### බැංකුවේ ව්‍යාපාරවලට සහභාගිවීමේ ගිවිසුම

සහභාගිවීමේ ගිවිසුම.

**57.** (1) බැංකුවේ ව්‍යාපාරවලට යම් ජාත්‍යන්තර හෝ කලාපීය මූල්‍ය ආයතනයක සහභාගිත්වය සඳහා ඒ ආයතනය සමඟ ගිවිසුමකට ඇතුළත් වීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මෙයින් බලය දෙනු ලැබේ; තව ද එවැනි ගිවිසුමකට ඇතුළත් වූ විට ගිවිසුමෙහි තත් කාර්ය සඳහා සඳහන් කර තිබෙන දිනයක සිට ඒ ආයතනය මේ පනතේ කාර්ය සඳහා සහභාගිවන්නකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ගිවිසුමක ඇතුළත් කළ යුතු ලෙස මේ පනතින් නියමිත හෝ ඇතුළත් කිරීමට මේ පනතින් බලය ලැබෙන විධිවිධානවලට අතිරේකව අවශ්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබන ප්‍රතිඥප්ති සහ කොන්දේසි ද ඒ ගිවිසුමේ ඇතුළත් කළ හැකි ය.

(3) සහභාගිවන්නකු විසින් මේ පනත යටතේ හෝ මේ පනතේ කාර්ය සඳහා හෝ ක්‍රියාත්මක කළ හැකි සියලු අයිතිවාසි කම් හෝ බලතල තත් කාර්යය සඳහා ගිවිසුමෙහි සඳහන් වන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සහභාගිවන්නා වෙනු වෙන් එහි සඳහන් වන ආකාරයට ක්‍රියාත්මක කළ හැකි අතර එසේ ක්‍රියාත්මක කරනු ලැබුවහොත්, සහභාගිවන්නා විසින් ඒ අයිතිවාසිකම් හෝ බලතල යථා පරිදි ක්‍රියාත්මක කරනු ලැබූ ලෙස මේ පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය.

මේ කොටස අදාළ කිරීම.

**58.** යටත් පිරිසෙයින් එක සහභාගිවන්නකුවත් සිටින තාක් කල් පමණක් 59 වන වගන්තියේ සිට 63 වන වගන්තිය තෙක් වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළුව) විධිවිධාන අදාළ විය යුතු ය.

බැංකුවේ ප්‍රාග්ධනය සඳහා සහභාගිවන්නකුගේ දායක මුදල.

**59.** (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සහභාගිවන්නකු විසින් ඔහු පාර්ශ්වකරුවකු වූ ද, 57 (1) වන වගන්තියේ සඳහන් වන්නා වූ ද ගිවිසුමෙහි සඳහන් වන යම් මුදල් ප්‍රමාණයක් හෝ එවැනි මුදල් ප්‍රමාණයක් සඳහන් කර නොමැති නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා ආරම්භක දායක මුදලක් වශයෙන් ගෙවිය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොටස් හිමියන් විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා යම් වැඩිදුර දායක මුදලක් ගෙවා ඇති අවස්ථාවක බැංකුවෙහි ප්‍රාග්ධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, සහභාගිවන්නකු විසින් වැඩිදුර දායක මුදලක් වශයෙන් ගෙවනු ලැබිය හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන මෙහි පහත දැක්වෙන සීමාකිරීම්වලට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය. එනම්:—

(අ) එක් සහභාගිවන්නකු පමණක් සිටින අවස්ථාවක, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ ආරම්භක දායක මුදල හෝ (1) වන හා (2) වන උපවගන්ති යටතේ ඔහුගේ දායක මුදල්වල මුළු එකතුව බැංකුවේ තත් කාලයේ ප්‍රාග්ධනයෙන් සියයට හතලිස් නවයක් නොඉක්මවිය යුතු ය; නැතහොත්

(ආ) සහභාගිවන්නන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින අවස්ථාවක, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා (1) වන උපවගන්තිය යටතේ ඔවුන්ගේ ආරම්භක දායක මුදල්වල මුළු එකතුව හෝ (1) වන හා (2) වන උපවගන්ති යටතේ ඔවුන්ගේ දායක මුදල්වල මුළු එකතුව බැංකුවේ තත් කාලයේ ප්‍රාග්ධනයෙන් සියයට හතළිස් නවයක් නොඉක්ම විය යුතු ය.

සහභාගිවන්නන් බැංකුවේ කොටස් හිමියන් වන බව.

**60.** (1) සහභාගිවන්නකු බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායක වී තිබීමේ හේතුවෙන් බැංකුවේ කොටස් හිමියකු විය යුතු ය. ඒ අනුව, ඒ සහභාගිවන්නා දායක වූ මුදල් ප්‍රමාණයට සමාන මුදලක් දක්වා එකක් රුපියල් එක් සියයක නාම මාත්‍ර අගයකින් යුත් කොටස් සඳහා සහතික බැංකුව විසින් සහභාගිවන්නාට නිකුත් කළ යුතු ය.

(2) යම් සහභාගිවන්නකු දරන යම් කොටස් වෙනත් කෙනකුට පැවරීමට හෝ බැහැර කිරීමට ඔහුට ඇති අයිතිය, ඒ සම්බන්ධයෙන් මේ පනතේ සඳහන් විධිවිධානවලට සහ ඒ සහභාගිවන්නා පාර්ශ්වකරුවකු වූ ද 57 (1) වන වගන්තිය යටතේ ඇතුල් වූ ද ගිවිසුමේ සඳහන් විධිවිධානවලට යටත් විය යුතු ය; තවද, එවැනි යම් කොටස් වෙනත් යම් තැනැත්තකුට යථා පරිදි පවරනු ලැබුව හොත්, එකී වෙනත් තැනැත්තා සහභාගිවන්නා විණි නම් සාකල්‍යයෙන් ම ඒ කොටස් දරන ආකාරයෙන් ම සහ එසේ විණි

නම් ඒ කොටස් දැරීම යටත් වන්නේ (මේ පනතේ හෝ ඒ ගිවිසුමේ සඳහන්) යම් කොන්දේසිවලට ද, ඒ කොන්දේසිවලට ම යටත්ව ඒ කොටස් එකී වෙනත් තැනැත්තා විසින් දැරිය යුතු ය.

ඈවර කිරීම.

**61.** බැංකුව විසුරුවා හරිනු ලැබූ විටක, බැංකුවේ වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම අතුරින් වෙනත් තැනැත්තන්ට බැරකම් ගෙවීමෙන් පසුව ඉතිරිවන මුදල් ප්‍රමාණයට, තමන් දරන කොටස්වල නාමමාත්‍ර අගය අනුව, ප්‍රමාණානුකූලව සහභාගිවීමට බැංකුවේ කොටස් හිමියන්ට තමන් දරණ කොටස් හේතු කොට ගෙන හිමිකම ලැබිය යුතු ය.

සහභාගි වත්තන්ගේ කොටස් විකිණීම පිළිබඳ සීමාවන්.

**62.** (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව කැමැත්ත ලියවිල්ලකින් ලබාගෙන මිස සහ ඒ මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා අනුමත කරනු ලබන තැනැත්තකුට හෝ තැනැත්තකුගේ වාසියට හැර, බැංකුවේ යම් කොටසක් විකිණීමට, පවරා දීමට, වැයබරකට යටත් කිරීමට හෝ වෙනත් කවර වූ හෝ ආකාරයකින් අන්සතු කිරීමට නැතහොත් බැඳීමකට යටත් කිරීමට සහභාගිවන්නකුට හිමිකම් නොතිබිය යුතු ය.

(2) 57 වන වගන්තිය යටතේ ඇතුල් වූ යම් ගිවිසුමක පාර්ශ්ව කරුවකු වූ යම් සහභාගිවන්නකුගේ කොටස් විකිණීම හෝ අන්සතු කිරීම සඳහා වූ අදහසකට අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත දීම නොකළ යුත්තේ කවර හේතු නිසා ද යන වග සඳහන් කෙරෙන විධිවිධාන එකී ගිවිසුමෙහි ඇතුළත්ව ඇත්නම්, ඒ විධිවිධාන මෙහි ලා ඇතුළත් කරනු ලැබූවාක් මෙන් බලපැවැත්විය යුතු ය.

(3) සහභාගිවන්නකුගේ බැංකුවේ කොටස් කිසිවක්, සාමාන්‍යාධිකාරිවරයා විසින් ඒ සහභාගිවන්නාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු, අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව කැමැත්ත ඇතිව හැර, යම් අධිකරණයක ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේ ලා හෝ සහභාගිවන්නා බුන්වත්වීමක දී පැවරුම්ලාභියකු විසින් හෝ සහභාගිවන්නා සමාගමක් නම්, යම් ඈවරකරුවකු විසින් හෝ ඒ සමාගම වසා දැමීම සඳහා වූ යම් ක්‍රියා මාර්ගයක දී හෝ විකිණීම හෝ විකිණීමට යටත් කිරීම හෝ නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය මගින් නියමිත පරිදි පූර්ව කැමැත්ත ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක එසේ කැමැත්ත දෙනු වෙනුවට ඒ ඉල්ලීමට විෂය වූ කොටස් වෙනත් කොටස් හිමියකු විසින් අත් කර ගත යුතු යයි ඒ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(5) යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධාන බලපැවැත්විය යුතු අතර එකී ඉහතින් ඇති විධිවිධාන සහ එකී යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක ඇතුළත් කිසිවක් අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ විටක එකී විධිවිධාන එකී ලිඛිත නීතිය හෝ එකී වෙනත් නීතිය අභිභවා බලපැවැත්විය යුතු ය.

63. 62 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමක් අනුව සහභාගිවන්නකුගේ කොටස් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් හෝ කොටස් හිමියකු විසින් අත් කර ගනු ලබන අවස්ථාවක, එසේ අත් කර ගනු ලබන කොටස්වල වටිනාකම, ඒ සහභාගිවන්නා පාර්ශ්වකරුවකු වූ සහ 57 වන වගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුමෙහි දක්වා ඇති ආකාරයට සහ ඒ ගිවිසුමෙහි තත් කාර්යය සඳහා ඇතුළත් නියම හා කොන්දේසි අනුව නිශ්චය කළ යුතු ය. සහභාගිවන්නාගේ කොටස් තක්සේරු කිරීම.

64. මේ පනතේ මීට ඉහතින් ඇති විධිවිධාන යටතේ කොටස් හිමියකු විසින් අත් කර ගන්නා ලද හෝ මිල දී ගන්නා ලද සහභාගිවන්නකුගේ බැංකුවේ කොටස් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් හෝ සඳහා ඒ කොටස් හිමියා විසින් මුදල් ගෙවිය යුතු ය. කොටස්හිමියකු විසින් අත් කර ගනු ලබන කොටස් සඳහා ගෙවීම.

## V වන කොටස

### සාමාන්‍ය කරුණු

65. මෙහි පහත දැක්වෙන ලිඛිත නීතිවල විධිවිධාන බැංකුව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය :— ඇතැම් ලිඛිත නීති බැංකුව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බව.

(අ) මුදල් ණයට දීම පිළිබඳ ආඥාපනත ;

(ආ) ණය සහන ආඥාපනත ; සහ

(ඇ) 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත.

66. මුදල් නීති පනතේ කාර්ය සඳහා බැංකුව ණය දෙන ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව බැංකුව විසින් කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරන මුදල් ප්‍රමාණ ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍ය කාල සහ දීර්ඝ කාල ණය අරමුදලෙන් ණයට ගනු ලැබිය හැකි ය. බැංකුව ණය දෙන ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

67. තම කාර්ය නිසි පරිදි හා අවංක ලෙස ඉටු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වන පරිදි ඇප තැබිය යුත්තේ බැංකුවේ කවර පංතිවල නිලධරයන් ද යන වග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය. එසේ නිශ්චය කරනු ලැබූ යම් පංතියකට අයත් බැංකුවේ සෑම නිලධරයකු ම එසේ ඇප තැබිය යුතු ය. බැංකුවේ නිලධරයන් ඇප තැබිය යුතු බව.

68. බැංකුවට දරන්නට සිදුවූ යම් අලාභයක් හෝ පාඩුවක් බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ නිලධරයකුගේ විෂමාචාරය හෝ ඕනෑකමින් පැහැර හැරීම හෝ නිසා සිදුවූවක් නම් මිස, ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා ඒ අලාභය හෝ පාඩුව වෙනුවෙන් වගකීමට යටත් නොවිය යුතු ය. විෂමාචාරය හෝ ඕනෑකමින් පැහැර හැරීම නොවන හේතුවකින් සිදුවන අලාභ හෝ පාඩු සඳහා වගකීමට යටත් නොවන බව.

රහස්‍යතාව ප්‍රකාශ කිරීම.

**69.** බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකාරවරයකු ම, විගණකවරයකු ම, නිලධරයකු ම, සේවකයකු ම, අනුයෝජිතයකු ම, ගණකාධිකාරිවරයකු ම හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතු සඳහා සේවයෙහි යොදවනු ලබන වෙනත් සෑම තැනැත්තකු ම විසින් ස්වකීය කාර්ය ආරම්භ කිරීමට පෙර, බැංකුවේ සියලු ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන් සහ ගිණුම් පිළිබඳ තත්ත්වය සහ ඒවාට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙන ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන වෙනත් යම් කරුණක්—

(අ) එය හෙළිදරව් කරන ලෙස—

(i) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, හෝ

(ii) අධිකරණයක් විසින්, හෝ

(iii) එය අදාළ වන තැනැත්තා විසින්, හෝ

ඉල්ලා සිටි විටක ;

(ආ) ස්වකීය කාර්ය කිරීමේ දී ; සහ

(ඇ) මේ පනතේ යම් විධිවිධානයක් අනුව ක්‍රියා කිරීම පිණිස

හැර, හෙළිදරව් නොකිරීමට ද ඒ ප්‍රකාශයෙන් ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය.

**70.** කවර වූ හෝ අවස්ථාවක, බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් තමාගෙන් අසනු ලැබූ යම් ප්‍රශ්නයකට දෙන පිළිතුරෙන් බැංකුවේ රහස් හෝ බැංකුවේ යම් ගනුදෙනුකරුවකුගේ ව්‍යාපාර හෝ කටයුතු පිළිබඳ රහස් හෝ අනාවරණය වේ යයි හෝ අනාවරණය වීමට තුඩු දේ යයි බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් නිලධරයකු සලකන්නේ නම්, එසේ පිළිතුරු දෙන ලෙස අධිකරණයක් විසින් හෝ වෙනත් නීතියකින් හෝ නියම කරනු ලැබූ විටක හැර, ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම ඔහු විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

ලදුපත් වලංගු වන්නේ කවර අවස්ථාවල දී ද යන වග.

**71.** බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා විසින් අත්සන් කරන ලද ලදුපතක් හෝ ලදුපත් දීම සඳහා සාමාන්‍යාධිකාරිවරයා විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් අත්සන් කරන ලද ලදුපතක්, බැංකුවට ගෙවිය යුතු මුදල් ගෙවා සාර්ථක ලෙස නිදහස් වූ බවට සාක්ෂියක් විය යුතු ය.

ගිවිසුම්.

**72.** (1) බැංකුව වෙනුවෙන් මෙහි පහත දක්වෙන පරිදි ගිවිසුම් ඇති කර ගත හැකි ය :—

(අ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද නම්, නීතිය අනුව ලියවිල්ලකින් විය යුතු වූ ගිවිසුමක්, බැංකුව වෙනුවෙන්, බැංකුවේ පොදු මුද්‍රාව යටතේ ලියවිල්ලකින් ඇති කර ගත හැකි ය ;

(ආ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද නම්, නීතිය අනුව ලියවිල්ලකින් විය යුතු වූ සහ එහි පාර්ශ්ව කරුවන් විසින් අත්සන් කරනු ලැබිය යුතු වූ ගිවිසුමක්, බැංකුව වෙනුවෙන්, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති

පරිදි තත් කාර්යය සඳහා විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තන් විසින් අත්සන් කොට ලියවිල්ලකින් ඇති කර ගත හැකි ය ; තව ද

(ඇ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද නම්, ලියවිල්ලකින් නොමැතිව වාචිකව පමණක් ඇති කර ගන්නා ලද නමුදු නීතියෙන් වලංගු වන ගිවිසුමක්, බැංකුව වෙනුවෙන්, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි තත් කාර්යය සඳහා විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් විසින් වාචිකව ඇති කර ගත හැකි ය.

(2) මේ වගන්තිය අනුව ඇති කර ගන්නා ලද ගිවිසුමක් නීතියෙහි ලා බලාත්විත විය යුතු අතර බැංකුව ද ඒ ගිවිසුමේ වෙනත් සියලු පාර්ශ්වකරුවන් ද ඔවුන්ගේ නීත්‍යනුකූල නියෝජිතයන් ද ඉන් බැඳීමකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය අනුව ඇති කර ගන්නා ලද ගිවිසුමක්, එය ඇති කර ගැනීමට මේ වගන්තියෙන් බලය පැවරී ඇති ආකාරයෙන් ම වෙනස් කිරීමට හෝ අවසාන කිරීමට හෝ හැකි ය.

විනිමය පත්‍ර සහ පොරොන්දු නෝට්ටු.

**73.** විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් බැංකුව වෙනුවෙන් සෑදීමට, ලියා අත්සන් කිරීමට හෝ පිටසන් කිරීමට මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් බැංකුවේ නමින් හෝ බැංකුව වෙනුවෙන් හෝ බැංකුව සඳහා සාදන ලද, ලියා අත්සන් කරන ලද හෝ පිටසන් කරන ලද විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් බැංකුව වෙනුවෙන් සාදන ලද, ලියා අත්සන් කරන ලද හෝ පිටසන් කරන ලද විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් සේ සැලකිය යුතු ය.

බැංකුව වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය දී ඇති තැනැත්තෝ.

**74.** සාමාන්‍යාධිකාරිවරයාට සහ යම් පොරොන්දු නෝට්ටුවක්, විනිමය පත්‍රයක්, චෙක්පතක් හෝ මුදල් ගෙවීම සඳහා ඇණවුමක් බැංකුවේ නමින් හෝ බැංකුව වෙනුවෙන් සෑදීමට, අණ කිරීමට, පිළි ගැනීමට හෝ පිටසන් කිරීමට හෝ බැංකුව කෙරෙහි වගකීමක් පැවරෙන පරිදි යම් ගිවිසුමකට ඇතුළත් වීමට නැතහොත් බැංකුවේ කීර්තිය ඔඩපනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය පවරනු ලැබුවා වූ ද තමන් වෙත එසේ පවරන ලද බලයේ සීමා ඇතුළත ක්‍රියා කරන්නා වූ ද තැනැත්තන්ට හැර, වෙනත් කිසිම තැනැත්තකුට ඒ කිසිම ක්‍රියාවක් කිරීමට බලය නොතිබිය යුතු ය.

විදේශයන්හි දී ඔප්පු ලියා අත්සන් කර දීම.

**75.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත කවර වූ හෝ ස්ථානයක දී බැංකුව වෙනුවෙන් බැංකුවේ ඇටෝර්නි බලකරු ලෙස ඔප්පු ලියා අත්සන් කිරීමට, පොදුවේ හෝ යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් හෝ බැංකුව විසින් බැංකුවේ පොදු මුද්‍රාව යටතේ යම් තැනැත්තකුට ලියවිල්ලකින් බලය දිය හැකි ය.

(2) එවැනි ඇටෝර්නි බලකරුවකු විසින් බැංකුව වෙනුවෙන් ස්වකීය අත්සන හෝ මුද්‍රාව යටතේ අත්සන් කරන ලද ඔප්පුවකින් බැංකුව බැඳීමකට යටත් විය යුතු අතර එය බැංකුවේ පොදු මුද්‍රාව යටතේ අත්සන් කරන ලද ඔප්පුවක් වූවාක් මෙන් බල සහිත විය යුතු ය.

රීති. **76.** මේ පනතේ විධිවිධානවලට හෝ මනා බැංකු ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය:—

(අ) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත කරුණු;

(ආ) රීති සෑදීමට මේ පනත යටතේ නියම කරනු ලැබ තිබෙන්නේ හෝ බලය පවරනු ලැබ තිබෙන්නේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කරුණු; සහ

(ඇ) ස්වකීය අරමුණු සාර්ථකව ඉටු කර ගැනීමට ද, බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය කිරීමට හා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බැංකුවට හැකිවනු පිණිස අවශ්‍ය කරුණු.

වැරදි. **77.** (1) මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ මේ පනතේ යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම ද;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වේ නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම ද

ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, ඒ වරද කරන ලද්දේ තමා නොදැනුවත්ව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු අනලස්භාවයෙන් යුතුව ක්‍රියා කළ බව ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ නිලධරයකු විසින් හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නො සැලකිය යුතු ය.

78. (1) බැංකුවේ ප්‍රාග්ධනයට දායක වීමට ද බැංකුව විසින් නිකුත් කරනු ලබන කොටස්, ස්කන්ධ, ණයකර, පොරොන්දු නෝට්ටු හෝ වෙනත් සුරැකුම්පත් මිළ දී ගැනීමට, ඒවාට ඇපවීමට, හෝ ඇප වශයෙන් ඒවා පිළිගැනීමට ද, මුදල් නීති පනතේ 117 වන සහ 125 වන වගන්තිවල විධිවිධාන නොසලකා, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

කොටස් හිමියන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, බැංකුවේ ප්‍රාග්ධනයට දායක වීමට ලංකා බැංකුවට සහ මහජන බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

79. බැංකුවේ කාර්ය කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොදු හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල ලියවිල්ලකින් දිය හැකි අතර ඒ විධාන අනුව ක්‍රියා කිරීම බැංකුවේ යුතුකම විය යුතු ය.

අමාත්‍යවරයා විසින් විධාන දෙනු ලැබිය හැකි බව.

80. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු අදහස් වේ;

"අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ;

"අනුමත ණය දෙන ආයතනය" යන්නෙහි, මුදල් නීති පනතේ 88 ඊ වන වගන්තියේ "ණය දෙන ආයතනය" යන්නට දී ඇති අර්ථය ම ඇති අතර, මේ පනතේ කාර්ය සඳහා අනුමත ණය දෙන ආයතන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන වෙනත් ආයතන ද ඊට ඇතුළත් වේ;

"කර්මාන්තය" යන්නට 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ අර්ථානුකූල වූ සංචාරක ව්‍යාපාරය සහ සංචාරක සේවා ද, ආකර කර්මාන්තය සහ ධීවර කර්මාන්තය ද ඇතුළත් වන අතර "කාර්මික" යන පදයෙහි අර්ථය ඒ අනුව තේරුම් ගත යුතු ය;

"කොටස් හිමියා" යන්නෙන්, බැංකුවේ කොටස් හිමියකු අදහස් වේ;

"මහජන බැංකුව" යන්නෙන්, 1961 අංක 29 දරන පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, මුදල් නීති පනතේ 8 වන වගන්තිය යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"ලංකා බැංකුව" යන්නෙන්, ලංකා බැංකුව ආඥපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන්, කවර හෝ නාමයකින් හෝ පදවි නාමයකින් හැඳින්වෙන, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර ඊට ඒක පුද්ගල සංස්ථාවක් හෝ තනි හිමිකාරකමක් ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

## උපලේඛනය

### "අ" ආකෘතිය

### විකුණුම් සහතිකයේ ආකෘතිය—[50 (3) වන වගන්තිය]

............................ ගෙන් ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවට රුපියල් ...............ක මුදලක් අය විය යුතුව ඇති හෙයින් හා අංක............... දරන බැඳුම්කරයෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඉහත කී මුදල ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, ...............යනුවෙන් හඳුන්වනු ලබන හා මෙහි උපලේඛනයෙහි වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති දේපළ, එකී .......................විසින් ඒ බැඳුම්කරය පිට උකස් කර ඇති හෙයින් ද:

එකී බැඳුම්කරය සම්බන්ධයෙන් අය විය යුතු මුදලක් එකී ........................ විසින් ගෙවා නොමැති හෙයින් ද:

එකී ඉඩම් 1979 අංක ............ දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතට අනුකූලව ............ක්වූ ............... මස ............ වන දින දී විකුණන ලද හෙයින් හා එය .................. පදිංචි ............... විසින් රුපියල් .........ක්වූ මුදලකට මිලට ගනු ලැබ, එකී ............... විසින් එකී මුදල යථා පරිදි ගෙවන ලද හෙයින් ද:

පහත සඳහන් දේපළ, එනම් (මායිම් හා ඉම් සලකුණු සහිතව නිවැරදිව දේපළ මෙහි විස්තර කරන්න) රුපියල් ..................ක්වූ මුදලකට .................. ට විකුණනු ලැබූ අතර එකී .................. විසින් එය මිලයට ගෙන, ඒ මුදල ඔහු විසින් යථා පරිදි ගෙවන ලද බවත් ඒ දේපළ එකී ..............., ඔහුගේ උරුමක්කාරයන්, පොල්මෑකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් හා පැවරුම්ලාභීන් සතු වන බවත්, මින් ඉදිරියට එසේ සතුව පවතින බවත්, එකී පනතින් සහ ඒ පනත යටතේ සාදන ලද රීතිවලින් තත් කාර්ය සඳහා මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා ඒ බලතල ක්‍රියාත්මක කරමින් (ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා) ............ වන මා මෙයින් සහතික කරන බව දත යුතු ය.

............ක්වූ ............ මස ...... වන දින වූ මෙදින බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා .................. ඉදිරිපිට දී බැංකුවේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

.......................,
සාමාන්‍යාධිකාරී.

### "ආ" ආකෘතිය

### විකුණුම් සහතිකයේ ආකෘතිය—[50 (3) වන වගන්තිය]

............................... ගෙන් ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවට රුපියල් ..............ක මුදලක් අය විය යුතුව ඇති හෙයින් හා අංක.............. දරන බැඳුම්කරයෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඉහත කී මුදල ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, ..............යනුවෙන් හඳුන්වනු ලබන හා මෙහි උපලේඛන යෙහි වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති දේපළ, එකී .......................විසින් ඒ බැඳුම්කරය පිට උකස් කර ඇති හෙයින් ද:

එකී බැඳුම්කරය සම්බන්ධයෙන් අය විය යුතු මුදලක් එකී ....................... විසින් ගෙවා නොමැති හෙයින් ද:

එකී ඉඩම 1979 අංක ........... දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතට අනුකූලව .................ක්වූ ............ මස ...... වන දින දී විකුණන ලද හෙයින් හා ඒය .................. විසින් ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව සඳහා සහ වෙනුවෙන් රුපියල් .................ක්වූ මුදලකට මිලට ගනු ලැබ, ඉහත කී පරිදි අය විය යුතු මුදල පියවීමේ ලා ඉන් කොටසක් (හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ මුදල සම්පූර්ණයෙන් හෝ) එකී බැංකුවට බැර කරන ලද හෙයින් ද:

පහත සඳහන් දේපළ, එනම් (මායිම් හා ඉඩම් සලකුණු සහිතව නිවැරදිව දේපළ මෙහි විස්තර කරන්න) රුපියල් ..............ක්වූ මුදලකට ........... ට විකුණනු ලැබූ අතර එකී .................. විසින් එකී බැංකුව සඳහා සහ වෙනුවෙන් මිලට ගන්නා ලද බවත් ඒ දේපළ සම්පූර්ණයෙන් ම එකී බැංකුව සතුවන බවත්, මින් ඉදිරියට එසේ සතුව පවතින බවත් එකී පනතින් සහ ඒ පනත යටතේ සාදන ලද රීතිවලින් තත් කාර්යය සඳහා මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා ඒ බලතල ක්‍රියාත්මක කරමින් (ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා) .................... වන මා මෙයින් සහතික කරන බව දැනගත යුතුය.

............ක්වූ ............ මස ...... වන දින වූ මෙදින බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා .................. ඉදිරිපිට දී බැංකුවේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

..................,

සාමාන්‍යාධිකාරී.